සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

26937

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

## 9 - ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව

නම/විභාග අංකය :- ..................................................................... කාලය : පැය 02යි.

### I කොටස

- දී ඇති උපදෙස් පිළිපදිමින් ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 5 දක්වා දී ඇති ප්‍රකාශය නිවැරදි නම් 'නි' අක්ෂරය ද, වැරදි නම් 'වැ' අක්ෂරය ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

1) නිල් ග්‍රහයා ලෙස හැඳින්වෙන්නේ පෘථිවියයි. (.......)
2) ලොව උසම සානුව ටිබෙට් සානුවයි. (.......)
3) යුප්‍රටීස් ටයිග්‍රීස් ගංගා 'බෝහයි' බොක්කට ගලා බසී. (.......)
4) ආසියානු කලාපයේ ඉතා වැදගත් ස්වාභාවික වරාය වන්නේ ත්‍රිකුණාමලය වරාය යි. (.......)
5) පහත් ප්‍රදේශවල සමෝච්ච රේඛා ඉතා ළංව ද, උස් ප්‍රදේශවල දී සමෝච්ච රේඛා ඈතින් ද විහිදී ඇත්තේ උත්තල බෑවුමක දීය. (.......)

- අංක 6-10 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

6) 'සාහිත්‍යයටත්, ඉතිහාසයටත්, කලාවටත් මූලිකව අයත් වන දේ සංස්කෘතිය වේ.' මේ ප්‍රකාශය ඉදිරිපත් කළේ,
   1) චාල්ස්.ඒ.එල්වුඩ් විසිනි. 2) ඊ.බී.ටයිලර් විසිනි.
   3) බර්ට්‍රන්ඩ් රසල් සාමි විසිනි. 4) හෙරඩෝටස් විසිනි.

7) පතනශීලී වනාන්තරවල බහුලව දැකිය හැකි ශාක වර්ගයක් වන්නේ,
   1) මැහෝගනී ය. 2) රතු පයින් ය.
   3) බොක්ස්වුඩ් ය. 4) බුරුතය ය .

8) බදුල්ල දුම්රිය මාර්ගයේ පිහිටි දර්ශනීය දුම්රිය පොළකි.
   1) පට්ටිපොළ 2) පොල්ගහවෙල
   3) රඹුක්කන 4) ගාල්ල

9) තෙත්බිම් සංරක්ෂණය කිරීමේ අරමුණු ඇතිව පිහිටුවා ගත් ජාත්‍යන්තර සම්මුතිය කුමක් ද?
   1) මොන්ට්‍රියල් 2) රැම්සා
   3) රියෝ 4) බිමස්ටෙක්

10) 1:50000 පරිමාණයට අඳිනු ලබන සිතියමක භූමියේ 2cm දැක්වෙන සැබෑ දුර කොපමණ ද?
   1) කිලෝමීටර් භාගය යි. 2) කිලෝමීටර් එක යි.
   3) කිලෝමීටර් දෙක යි. 4) කිලෝමීටර් තුන යි.

• අංක 11 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

11) ඕසෝන් ස්තරය පිහිටා ඇත්තේ ................................ ගෝලයේ ය.

12) නිරපේක්ෂ පිහිටීම අනුව ආසියානු කලාපයේ උතුරු මායිම උතුරු අක්ෂාංශ .......................... දක්වා විහිදී ඇත.

13) නැගෙනහිර පුරවර කලාපයේ ධීවර වරාය සංවර්ධනය සඳහා ................................ වැඩසටහන ක්‍රියාත්මක වේ.

14) වර්තමාන අවශ්‍යතා සපුරා ගනිමින් අනාගත පරපුරෙහි අවශ්‍යතා සඳහා සම්පත් පරිහරණය ............................ සංවර්ධනය ලෙස හැඳින්වේ.

15) සාගරය දෙසට නෙරාගිය ගොඩබිම් ප්‍රදේශ .......................... වශයෙන් හැඳින්වේ.

16) උතුරු අර්ධ ගෝලයේ $23\frac{1}{2}^0$ රේඛාව ............................ නිවර්තනය ලෙස හැඳින්වේ.

17) ලෝක උරුමයක් ලෙස හඳුන්වන බාමියන් ප්‍රතිමා ................................ හී පිහිටා තිබේ.

18) මහවැලි කලාපයේ වැඩිම ජල විදුලි බල ධාරිතාවක් නිපද වන්නේ ................................ ජලාශයෙනි.

19) 1:50000 මෙට්‍රික් සිතියම්වල සමෝච්ච රේඛා අඳිනු ලබන්නේ ..................... වර්ණයෙනි.

20) දකුණු ආසියා කලාපයට අයත් .............................දූපත් සාගර ජලය ඉහළ යෑම නිසා අතුරුදහන් වේ යැයි අනුමාන කර ඇත.

## II කොටස

• පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

• පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

• පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

1) පාසල පදනම් කරගත් ඇගයීම් යටතේ තුන්වන වාර අවසානයේ 9 ශ්‍රේණියේ භූගෝල විද්‍යා විෂයය සඳහා කරන ලද ඇගයීම් ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබ හෝ ඔබ කණ්ඩායමට නිර්මාණ ඉදිරිපත් කිරීමට ලැබුණු මාතෘකාව කුමක් ද? (ල. 2)

(ii) එම මාතෘකාවට අදාළ ව තොරතුරු ගොනු කරන ලද අනු මාතෘකා දෙකක් සඳහන් කරන්න. (ල. 2)

(iii) ඔබ හෝ ඔබ කණ්ඩායමේ රැස් කළ තොරතුරුවල නිර්මාණාත්මක බව ඇති කරගැනීමට යෙදූ උපක්‍රම තුනක් සඳහන් කරන්න. (ල. 3)

(iv) මෙම නිර්මාණ කිරීමේ දී ඔබට අන් අයගෙන් ලැබුණු සහයෝගය කෙටියෙන් ලියන්න. (ල. 4)

(v) සිසු නිර්මාණාත්මක කුසලතාවයන් වර්ධනය කරගැනීමට මෙවැනි ඇගයීමක් උපකාරී වන්නේ කෙසේදැයි කෙටියෙන් ලියන්න. (ල. 5)

2) (i) පෘථිවි වායුගෝලය ප්‍රධාන ස්තර හතරකින් සමන්විත වේ. ඉන් දෙකක් නම් කරන්න. (ල. 2)

(ii) ජීවීන්ගේ පැවැත්මට හිතකර එකම ග්‍රහලෝකය පෘථිවිය යි .එසේ වීමට හේතු හතරක් ලියන්න. (ල. 4)


(iii) සාගර සම්පත මිනිසා ප්‍රයෝජනයට ගන්නා ආකාර තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ල. 5)

3) (i) ආසියා මහාද්වීපයේ නිශ්චිතව දැක්විය හැකි මායිම් දෙකක් ලියා දක්වන්න. (ල. 2)
(ii) ආසියා මහාද්වීපය එහි ප්‍රාදේශීය විවිධත්වය හා අනන්‍යතාව අනුව කලාප හයකට බෙදා දැක්විය හැකිය. එයින් ඔබ ජීවත් වන ප්‍රදේශය හැර වෙනත් ඕනෑම කලාප හතරක් නම් කරන්න. (ල. 4)
(iii) ආසියාවේ ව්‍යාපාරික කෘෂිකර්මය පිළිබඳව උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 5)

4) (i) ඔබ ජීවත් වන දිස්ත්‍රික්කය හැර බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න. (ල. 2)
(ii) මහවැලි සංවර්ධන ප්‍රදේශයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති හතරක් නම් කරන්න. (ල. 4)
(iii) උතුරු ප්‍රදේශයේ සංවර්ධනය ආශ්‍රිතව ඇති වී තිබෙන ගැටලු තුනක් පැහැදිලි කරන්න. (ල. 5)

5) (i) පරිසර ආචාර ධර්ම යනු කුමක් ද? (ල. 2)
(ii) පරිසර තුලිතතාව බිඳවැටීමට අහිතකර මානව ක්‍රියාකාරකම් රැසක් හේතු වී ඇත. එවැනි මානව ක්‍රියාකාරකම් හතරක් දක්වන්න. (ල. 4)
(iii) පරිසර තුලිතතාවට සිදු වන හානි අවම කරගැනීමේ අරමුණින් පිහිටුවා ගත් ආයතන තුනක් නම් කර ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)


6) (i) ආසියානු කලාපය තුළ ව්‍යාප්තව ඇති මානව වර්ග දෙක නම් කරන්න. (ල. 2)
(ii) සපයා ඇති ලෝක සිතියමේ,




a) A අක්ෂරයෙන් දැක්වෙන රට
b) B අක්ෂරයෙන් දැක්වෙන මුහුද
c) C අක්ෂරයෙන් දැක්වෙන ගංගාව
d) D අක්ෂරයෙන් දැක්වෙන මුහුදු බොක්ක, පිළිවෙළින් නම් කරන්න. (ල. 4)

(iii) ඉන්දියාවේ යකඩ හා වානේ කර්මාන්තය දියුණු වීමට බලපෑ හේතු තුනක් දක්වා එය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

7) ඔබ උගත් 1:50000 භූගෝල විද්‍යාත්මක සිතියම් ඇසුරෙන් පහතින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) පහතින් දක්වා ඇති භූවිෂමතා ලක්ෂණ දී ඇති වරහනින් තෝරාගෙන ලියා දක්වන්න.
(රැළිබිම, කොත්කන්ද, අවතල බෑවුම, උත්තල බෑවුම, කපොල්ල, දළ බෑවුම)

a) A-B ..................................................

b) C-D ..................................................

c) E-F ..................................................

d) G-H ..................................................

e) I-J .................................................. (ල. 5)

(ii) අතු ගංගාව, වගුරු බිම, ගං දහරය යන ලක්ෂණ සිතියමෙන් නිවැරදිවම හඳුනාගෙන එම ස්ථානවල ලියන්න. (ල. 3)

(iii) ගංගාව, මහා මාර්ගය හඳුනාගෙන සම්මත වර්ණ භාවිත කර සේයා කරන්න. (ල. 3)